(c) www.sinhalalyrics.com

වසන්තේ නිදා උන් යොවුන් කොකිලාවන්
ගයන්නේ සුපෙම් ගීත හේමන්තයෙදි
වසන්තේ ලපල්ලෙන් වැසී උන් කුසුම් වැල්
නටන්නේ පිපී දැන් හේමන්තයේදි

විලාපෙන් විඩාවී රැඳි මංතලාවෙ
වැසී අන්ධකාරෙන් වැටී මංමුළාවෙ
වලාවක් ලෙසින් මා ඇදෙද්දී අයාලේ
ඔබෙන් නෙත් ලැබුයේ හේමන්ත කාලේ

සුසුම් ලා දිවා රෑ වෙලී හුදකලාවේ
එපාවී සියල්ලෙන් පලා ආ වෙලාවේ
තුෂාරෙන් උදාවූ සඳක් සේ නිශාවේ
ඔබයි නෙත් සැදුයේ හෙමන්ත කාලේ

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - ස්වැන්ලි පීරිස්